

දැනට වඳවීමේ තර්ජනයකට ලක්වී තිබෙන බන්දුල පෙතියා නමැති මත්ස්‍යයා.

# බන්දුල පෙතියා වඳවීමේ තර්ජනයක



බන්දුල පෙතියා දැනට වැඩි වශයෙන් දක්නට ලැබෙන රබ්බිඩි ඇලේ ඉල්වල



රබ්බිඩිඇලේ ඉවුරු කඩා වැටී ඇති අයුරු පෙන්වන ගම්වැසියෙක්

ශ්‍රී ලංකාවට ආවේණික දැනට වරකාපොල ගලපිටමඩ ප්‍රදේශයේ ආශ්‍රිතව දිය පහරවල්වල පමණක් වාසය කරන බන්දුල පෙතියා නමැති මත්ස්‍යා වඳ වීමේ තර්ජනයකට ලක්වී සිටින මත්ස්‍යයා සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් සකස්කරන ලෙසද පරිසරවේදීහු ඉල්ලා සිටිති.

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගලපිටමඩ ආශ්‍රිත ප්‍රදේශවන රබ්බිඩිගල, හපුගොඩ, අල්පිටිය ප්‍රදේශවල පමණක් දැනට මෙම මත්ස්‍යා දැක ගැනීමට පුළුවන.

මේ පිළිබඳව අදහස් දක්වන හපුගොඩ ගොවි සංවිධානයේ සභාපති සරත් වීරක්කොඩි මහතා පවසන්නේ මෙවැනි කතාවකි.

බන්දුලි පෙතියා මුල්වරට සොයා ගන්නා ලද්දේ 1991 වසරේ රොහාන් පෙතියාගොඩ මහතා විසිනි. මෙම මත්ස්‍යයාගේ විද්‍යාත්මක නාමය වනුයේ PUNTIUS BANDARA යන්නයි. BANDULA BARD ඉංග්‍රීසි නාමයයි.

බන්දුල පෙතියා ප්‍රධාන වශයෙන් රබ්බිඩිගල ඇළේ පමණක් වාසය කරන නිසා මෙම ඇළ හා ඇළ දෙපස පරිසරය සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතුයි.

නීති රීති දමලා ආරක්ෂා කරනවාට වඩා ප්‍රදේශවාසීන්ට මෙම මත්ස්‍යයාගේ වටිනාකම තේරුම්ගෙන රැක ගැනීම වැදගත් වෙනවා. බන්දුල පෙතියාගේ හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේත් අනාගත පැවැත්ම ප්‍රදේශයෙහි මානව ක්‍රියාකාරකම් හා බද්ධ වී පවතින බැවින් මෙම මහඟු ජෛව විද්‍යාත්මක සම්පත අනාගත පරපුර උදෙසා සුරැකීම අප සැමගේ යුතු කමකි.

මේ පිළිබඳව අදහස් දක්වන ගලපිටමඩ ප්‍රදේශයේ පදිංචි ආර්. එම්. සුදත් වි-රත්න මහතා:- දැනට බන්දුල පෙතියා දක්නට ලැබෙන්නේ රබ්බිඩිගල, හපුගොඩ ප්‍රදේශ ඔස්සේ ගලා බසින රබ්බිඩිගල ඇළේ පමණයි. මෙම ප්‍රදේශයේ ජන ජීවිතය කෘෂිකර්මය පදනම් කරගෙන පවතී. එබැවින් ගැමියන් දොළ පහර සමග බැඳී ඇත. මොවුන්ගේ කෘෂිකාර්මික කටයුතු වන කුඹුරු, රබර් වගා හා ගොඩ ගොවිතැන සඳහාද ගවයන් නෑවීම, නිවෙස්වල ආහාර පිසීම වැනි දෛනික කටයුතු සඳහාද ජලය ලබා ගන්නේ මෙම ඇළෙනි. මෙම ක්‍රියාවලින් හා සබැඳුනු ජල පෝෂක ප්‍රදේශය හා ඇළ පහර දෙපස එළි කිරීම කෘෂිරසායනික හා රසායනික පොහොර දොළට එකතු වීම, විනෝදයට හා ආහාර පිසීමට මසුන් මැරීම වැලිගොඩ දැමීම නිසා ඉවුරු කඩා වැටීමෙන් දොළ පහර පටුවීම වැනි අහිතකර මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බන්දුල පෙතියා වඳවීමේ තර්ජනයකට ලක්වී . තිබෙනවා.



පූජ්‍ය දුනුමාලේ ගුණානන්ද හිමි



ආර්. එම්. සුදත් වි-රත්න මහතා



එච්. එම්. විජයරත්න මහත්මිය

මේ පිළිබඳව අදහස් දක්වන ගලපිටමඩ ප්‍රදේශයේ පදිංචි විශ්‍රාමලත් පාඨශාලාචාර්ය එම්. එම්. විජයරත්න මහත්මිය.

ගලපිටමඩ, රබ්බිඩිගල, හපුගොඩ අල්පිටිය ආශ්‍රිත ප්‍රදේශවල කුඩා දිය පහරවල්වල මෙම බන්දුල පෙතියා වාසය කරනවා. මට දැන් වයස 71 ක් වෙනවා. අපි කුඩා කාලයේ මේ මත්ස්‍යා විශාල වශයෙන් ප්‍රදේශයේ දිය පහරවල්වල දකින්නට ලැබුණා. නමුත් අද වන විට එහෙම දකින්නට ලැබෙන්නේ නැහැ.

මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ කෘෂි රසායනික ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා කිරීමයි. ඉස්සර වැඩි වශයෙන් භාවිතා කළේ කාබනික පොහොර නිසා කුඹුරේ ජලය ඇළ මාර්ගය අවට මසුන්ට හානියක් සිදුවුණේ නැහැ. දැන් ඇළ මාර්ගයට එන වතුර මසුන්ට අහිතකරයි.

බන්දුල පෙතියා වැඩි වශයෙන් ජීවත්වන රබ්බිඩිගල ඇළේ ඉවුරු අද කඩා වැටිලා. මසුන් සිටිය කුඩා වළවල් පිරිලා. එම නිසා මසුන්ට ජීවත් වීමට සුදුසු පරිසරයක් නැහැ. බලධාරීන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ අපේ ප්‍රදේශයට ආවේණික මෙම මත්ස්‍යා සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙසයි. එකපොල අල්පිටිය ගොවි සංවිධානයේ සභාපති කේ. වි-සිංහ මහතා.

බන්දුල පෙතියා අප ප්‍රදේශයේ ආඩම්බරයක්. මෙම මත්ස්‍යා හඳුනා ගැනීමට පෙර විශාල මත්ස්‍ය ගහණයක් සිටියා. නමුත් අද වන විට මෙම මත්ස්‍යා වඳ වෙමින් පවතිනවා. වර්තමානයේ පරිසරයේ ජීවත්වන දියකාවන් ප්‍රමාණය වැඩිවෙලා. මෙසේ වැඩි වීම නිසා බන්දුල පෙතියා බෝවීම අඩුවෙලා. අල්පිටිය, රබ්බිඩිගල. හපුගොඩ ගම්වාසීන් මෙම මත්ෂ්‍යයා රැක ගැනීමට දැඩි වෙහෙසක් ගන්නවා.

මේ පිළිබඳව අදහස් දක්වන දුනුමාලේ ගුණානන්ද හිමි,

බන්දුල පෙතියා අප ප්‍රදේශයට සම්පතක්. එම නිසා අප විහාරස්ථානයේ දායක සභාවේ මහත්වරු මේ මත්ස්‍යයා රැක ගැනීමට කටයුතු කරනවා. නමුත් රජය වැඩි වශයෙන් වඳවීමේ තර්ජනයකට ලක්වී සිටින මෙම මත්ස්‍යයා සංරක්ෂණය කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි. ඒ සඳහා දැනට සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් තිබුණත් එය ප්‍රමාණවත් නොවන බවයි අපට හැඟෙන්නේ.

● තල්දුව - **අංජුල නිශාන්ත**